මලියදේව විද්‍යාලයීය ආදිශිෂ්‍ය සුබසාධක සංගමය

# මෙහෙවර ප්‍රකාශනය

# 2018

**** සාමාජික සුබසාධනය ****

CS CamScanner

## සාමාජික සුබසාධනය සඳහා මෙතෙක් සිදුකල මෙහෙවර

(*** පෙර පැවති කෘත්‍යාධිකාරී මණ්ඩල නිලධාරීන්ගෙන් ලබාගත් තොරතුරු හා පැරණි ලේඛන අනුසාරයෙන් සකස්කරන ලදී. ***)

- දිවයිනේ කීර්තිමත් බෞද්ධ විද්‍යාලයක ආදිශිෂ්‍යයන් වශයෙන් රෝගී වූ ජනතාවට පිළිසරණක්වීමේ උදාරතර පරමාර්ථය පෙරදැරිකරගෙන, සාමාජීය මෙහෙවරක් ඉටුකිරීම උදෙසා වාර්ෂිකව සංවිධානය කරන ලේ දන්දීමේ ව්‍යාපෘතිය.

- විද්‍යාලයීය වාර්ෂික කඨින පිංකම සඳහා මූල්‍ය අනුග්‍රහය සහ සක්‍රිය දායකත්වයලබාදීම.

- විද්‍යාලයේ ආදි කතෘවරුන්හට හා ගුරුභවතුන්ට සෙත්පතා සංවිධානය කරන වාර්ෂික ඕල්කට් ගුණානුස්මරන පිරිත් පිංකම හා සාංඝික දානය සඳහා මූල්‍ය අනුග්‍රහය සහ සක්‍රීය දායකත්වය ලබාදීම.

- ආදිශිෂ්‍ය සංගමයේ අවශ්‍යතාවය සහ ඉල්ලීම මත විද්‍යාලයේ විවිධ උත්සව අවස්ථා සඳහා හිස් වැසුම් සැපයීම.

- 2005 වසරේ විද්‍යාලයේ පරිඝණක මධ්‍යස්ථානයට මල්ටි මීඩියා යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම. (දායකත්වය සිරිසර ස්ටූඩියෝ අධිපති ජගත් සිල්වා මහතා)

- සාමාජිකයින්ගේ අවශ්‍යතාවයමත සහ සංගමයේ වත්කම් වර්ධනය කරගැනීම සඳහා ටයි-පින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම - 2005 වර්ෂය

- සංගමයේ සාමාජිකයින්ගේ පවුල් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කරගැනීම පිණිස වාර්ෂික විනෝද චාරිකාවක් සුභසාධක සංගමයේ පූර්ණ අනුග්‍රහයෙන් සංවිධානය කිරීම.

- 1999 වසරේදී සුභසාධක සංගමයේ සාමාජිකයින් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.

- 1998 වසරේදී සුභසාධක සංගමයේ සාමාජිකයින්ගේ දරුවන් උදෙසා රැකියා ලබාදීමේවැඩපිලිවෙලක් සංවිධානය කිරීම.

- 2000 වසරේදී - සාමාජිකයන්ගේ දරුවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ සඳහා ශිෂ්‍යත්ව වැඩපිළිවෙලක් සංවිධානය කිරීම. එහිදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සෑම දරුවකු සඳහා (සාමාජිකයාගේ ඉල්ලීම පරිදි) රු 2000ක ශිෂ්‍යත්වයක් පිරිනැමීම. (එක් වරක් පමණි)

- 2000 වසරේදී - සාමාජිකයකුගේ අභාවයෙන් අනතුරුව ඔහුගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වසරක් යන තුරු රුපියල් 500 ක මූල්‍යාධාරයක් පිරිනැමීම. (මියගිය සාමාජිකයාගේ පවුලේ අවශ්‍යතාවය පරිදි)

CS CamScanner

- 2000 වසරේදී - සාමාජිකයකු හදිසි අනතුරකට හෝ බරපතලරෝගාබාධයන්ට ගොදුරු වන අවස්ථාවන්හිදී සාමාජිකයාගේ ඉල්ලීම පරිදිවෛද්‍යාධාර සඳහා මූල්‍යාධාර පිරිනැමීම.

- 2001 වසරේදී - විද්‍යාලයීය නව බුදුමැදුර සඳහා තිර රෙදි පරිත්‍යාග කිරීම.

- 2001 වසරේදී - මලියදේවආදිශිෂ්‍ය සංගමයේ සුභසාධක අනුකමිටුවේ මගපෙන්වීම හා උපදෙස් මත ආදිශිෂ්‍යයන් සඳහා සුහද හමුවක් ("දේවන්ස් ඩේ") මාලිගාපිටියේදී සංවිධානය කිරීම.

- 2002 වසරේදී - විද්‍යාලයේ විද්‍යාලයේ කාර්යය මණ්ඩලයේ හා ආදිශිෂ්‍ය සංගමයේ අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කිරීම පිණිස දිවාභෝජන සංග්‍රහයක් විද්‍යාලයේ ගුරු මණ්ඩලය වෙත සංවිධානය කිරීම.

- පාසැලේ ශිෂ්‍යන්ගේ අධ්‍යාපන කටයුතු උසස් තලයකට නැංවීම සඳහා ඉමහත් පරිශ්‍රමයක් දැක්වූ ගුරුභවතුන්ගේ අභාවයන් රාශියකට, අප සංගමයේ ශෝකය ප්‍රකාශ කිරීම පිණිස මරණගෙදරට මල්වඩමක් සැපයීම සහ ඒ සඳහා සාමාජිකයින් යොමුකිරීම හා නිළධාරීන් සහභාගිවීම සිදුකරන ලදී.

- 2013-2014 දැවසර තුල විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ සිසුකුසලතා ඇගයීමේ උළෙල සඳහා පූර්ණ මූල්‍ය අනුග්‍රහය ලබාදීම.

- 2015 වර්ෂයේදී - මලිදෙව් මේලා 2015 ව්‍යාපෘතියේ ප්‍රවේශපත්‍ර පොත් 303ක් (ප්‍රවේශ පත්‍ර 3333ක්) අළෙවි කරදීම තුලින් රුපියල් තුන්ලක්ෂ තිස් දහසක මුදලක් සංගමය වෙත බැර කිරීම.මේ සඳහා සුභසාධක සංගමය මගින් ව්‍යාපෘති 04ක් සංවිධානය කරන ලදී.

- ආරම්භයේ සිට සාමාජිකයින්ගේ අභාවයන් වෙනුවෙන් මරණාධාර ලෙස රුපියල් 735,000ක් මියගිය සාමාජිකයින්ගේ පවුල් 75 ක් අතර ප්‍රධානය කර ඇත.

- 2015 වර්ෂයේදී - මලිදෙව් මේලා ව්‍යාපෘතියේප්‍රවේශපත්‍ර කවුළු භාරව රාජකාරි සඳහා සුභසාධක සංගමයේපූර්ණ අනුග්‍රහය මත සාමාජිකයින් පුරා දින 7ක් යෙදවීම. එමගින් ප්‍රවේශ පත්‍ර පොත් 1162ක් අලෙවි කිරීම තුලින් සංගමයට ***රුපියල් දොලොස් ලක්ෂ හැත්තෑ අටදහස් දෙසීයක් මුදලක්*** අත්කර දීම සහ පුරා දින 7ක් සංවිධාන කටයුතු සඳහා සංගමයේ සාමාජිකයින් සහභාගී කරවීම. මෙසඳහා සුභසාධක සංගමය මගින් ව්‍යාපෘති 12ක් සංවිධානය කරන ලදී.

- 2016 වර්ෂයේදී - වාර්ෂික ක්‍රීඩා උත්සවය සඳහා සහතික පත්‍ර සඳහා මුද්‍රණ අනුග්‍රහය ලබාදීම, තිස්ස, ගැමුණු, රාජසිංහ සහ පරාක්‍රම නිවාස සඳහා කේක් ත්‍යාග සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම සහ පදක්කම් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම. (2016 වසරේ ප්‍රථම වරාවට සිදුකල අතර ඉන්පසු ආදිශිෂ්‍ය සංගමය විසින් අවස්තාවක් ලබාදී නොමැත.)

- 2016 වර්ෂයේදී - මලිදෙව් මේලා ව්‍යාපෘතිය හා සමගාමීව දියත්කල "දේවන්ස්ඩ්‍රෝ"ව්‍යාපෘතියේ ප්‍රවේශපත්‍ර පොත් 200ක් (ප්‍රවේශ පත්‍ර 2000ක්) අළෙවි කරදීම

CamScanner

තුලින් රුපියල් ලක්ෂ දෙකක මුදලක් සංගමය වෙත බැර කිරීම. මේ සඳහා සුභසාධක සංගමය මගින් ව්‍යාපෘති 04 ක් සංවිධානය කරන ලදී.

- 2016 වර්ෂයේදී - මලිදෙව් මේලා ව්‍යාපෘතියේ ප්‍රවර්ධන වැඩ සටහනට සහායවීම පිණිස 2016-06-18 දින රිදීගම සති අන්ත පොළ හා රිදීගම නගරය ප්‍රදේශයේ මලිදෙව්මේලා ප්‍රවර්ධන වැඩසටහනක් ව්‍යාපෘතියක් ලෙස සිදුකිරීම.

- 2016 වර්ෂයේදී - මලිදෙව් මේලා ව්‍යාපෘතියසදහා පුරා දින 06ක් සංගමයේ සාමාජිකයින් යොමුකරමින් සංවිධාන කටයුතු සඳහා සහායවීම පිණිස ව්‍යාපෘති 06ක් සිදුකරනලදී.

CS CamScanner

## සාමාජික සුභසාධනය සඳහා වර්තමානයේ ක්‍රියාත්මක ව්‍යාපෘති.

- අවමංගල්‍යාධාර ලබාදීමේ ව්‍යාපෘතිය
  - ✓ සාමාජිකයා මරණයට පත්වූඅවස්ථාවේදී රු 15,000ක මූල්‍යාධාරයක් සාමාජිකයාගේ පවුලේ සාමාජිකයින් වෙත පිරිනැමීම.
  - ✓ සංගමයේශෝකය ප්‍රකාශකරනු පිණිස බැනරය ප්‍රදර්ශණය කිරීම.
  - ✓ සංගමයේ ශෝකය ප්‍රකාශකරනු පිණිස මල්වඩමක් මරණ ගෙදරට සැපයීම.
  - ✓ මරණගෙදර කටයුතු අවසන් වනතෙක් අවම වශයෙන් සාමාජිකයින් 10 දෙනෙකු සක්‍රීය වශයෙන් මරණගෙදර කටයුතු සඳහා සහායවීම පිණිස සම්බන්ධ කිරීම.

- සංගමයේ සාමාජිකයින්ගේ පවුල් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කරගැනීම පිණිස වාර්ෂික විනෝද චාරිකාවක් සුභසාධක සංගමයේ පූර්ණ අනුග්‍රහයෙන් සංවිධානය කිරීම.

- දිවයිනේ කීර්තිමත් බෞද්ධ විද්‍යාලයක ආදිශිෂ්‍යයන් වශයෙන් රෝගී වූ ජනතාවට පිළිසරණක්වීමේ උදාරතර පරමාර්ථය පෙරදැරිකරගෙන, සාමාජීය මෙහෙවරක් ඉටුකිරීම උදෙසා වාර්ෂිකව සංවිධානය කරන ලේ දන්දීමේ ව්‍යාපෘතිය.

- සාමාජිකයින්ගේ දරුවන් උදෙසා රැකියා අවස්ථා සැලසීමේ ව්‍යාපෘතිය. (අදාල ආයතන වෙත යොමු කිරීම පමණි)

- අභාවයට පත්වූ සාමාජිකයින්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය.
  - ✓ අභාවයට පත්වූ සාමාජිකයාගේ පවුලේ ඉල්ලීම මත හා අවශ්‍යතාවය මත වසරක කාලයක් සඳහා රුපියල් 6,000ක උපරිමයකට යටත්ව (එක් පවුලක් සඳහා) කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සෘජු අධීක්ෂණය හා අනුමැතියට අනුව අධ්‍යාපන ආධාර ලබාදීම. මෙම ශිෂ්‍යත්වය පාසැල් අධ්‍යාපනය අවසන් වන තෙක්ම ප්‍රදානය කෙරේ.

- වාර්ෂික පිරිත් පිංකම
  මියගිය සාමාජිකයින්, විද්‍යාලයේ ගුරු භවතුන් ආදි කතෘන් හට පුණ්‍යානුමෝදනා කරනු පිණිස වාර්ෂිකව සර්ව රාත්‍රික පිරිත් පිංකමක් හා පසුදින සාංඝික දානයක් සංවිධානය කිරීම.

- හදිසි අසනීප තත්වයන්ට ගොදුරු වූ සාමාජිකයින්ගේ සුවදුක් විමසීම හා ඔවුනට සහාය වීම පිණිස කටයුතු සංවිධානය කිරීම (සෙත් පතා බෝධිපූජා පැවැත්වීම, සුදුසු වෛද්‍ය වරුන් වෙත යොමුකිරීම, අවශ්‍ය විටක දී සාමාජිකයාගේ ඉල්ලීම මත ප්‍රවාහන පහසුකම් සපයාදීම). එසේම සාමාජිකයාගේ අවශ්‍යතාවය මත මූල්‍යාධාර පිරිනැමීම.(**පවතින කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියට යටත්ව)

CamScanner

<u>සාමාජික සුභසාධනය සඳහා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති.</u>

**** පහත සඳහන් යෝජිත නව ව්‍යාපෘති 2018 - මැයි මස - 26 වැනි සෙනසුරාදා දින පැවැත් වූ සුභසාධක සංගමයේ කාර්‍යාධිකාරී මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත වූ යෝජනා ප්‍රකාරව සකස් කල අතර, උක්ත යෝජනා මහා සභාවකදී සම්මත කරගැනීමට නියමිතවේ. ****

- අවමංගල්‍යාධාර ව්‍යාපෘතිය
  - ✓ සාමාජිකයාගේ අභාවයකදී රු.25,000ක මරණපාරිතෝෂිකයක් සාමාජිකයාගේ පවුලේ සාමාජිකයින් වෙත ප්‍රදානය කිරීම.
  - ✓ සාමාජිකයා විවාහක නම් භාර්යාවගේ හෝ දරුවකුගේ අභාවයකදී රු. 10,000ක මරණපාරිතෝෂිකයක් සාමාජිකයා වෙත ප්‍රදානය කිරීම.
  - ✓ සංගමයේ ශෝකය ප්‍රකාශකරනු පිණිස බැනරය ප්‍රදර්ශණය කිරීම.
  - ✓ සංගමයේ ශෝකය ප්‍රකාශකරනු පිණිස මල්වඩමක් මරණ ගෙදරට සැපයීම.
  - ✓ මරණගෙදර කටයුතු අවසන් වනතෙක් අවම වශයෙන් සාමාජිකයින් 10 දෙනෙකු සක්‍රීය වශයෙන් මරණගෙදර කටයුතු සඳහා සහායවීම පිණිස සම්බන්ධ කිරීම.
  - ✓ මරණගෙදර සංග්‍රහ කටයුතු සඳහා සහායවීම පිණිස තේ සෑදීමේ යන්ත්‍රයක් (NestTea) සමග අවශ්‍ය දෑ සැපයීම. (රුපියල් පන්දහසක උපරිමයකට යටත්ව)
  - ✓ මරණගෙදර සඳහා අවශ්‍ය VIP කූඩාරමක් සැපයීම.

- අභාවයට පත්වූ සාමාජිකයින්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය.
  - ✓ අභාවයට පත්වූ සාමාජිකයාගේ පවුලේ ඉල්ලීම මත හා අවශ්‍යතාවය මත වසරකට රුපියල් 10,000ක උපරිමයකට යටත්ව (එක් පවුලක් සඳහා) කාර්‍යාධිකාරී මණ්ඩලයේ සෘජු අධීක්ෂණය හා අනුමැතියට අනුව අධ්‍යාපන ආධාර ලබාදීම.මෙම ශිෂ්‍යත්වය පාසැල් අධ්‍යාපනය අවසන් වන තෙක්ම ප්‍රදානය කෙරේ.

- මවසංගමයේ ආදිශිෂ්‍ය සංගම් කාර්යාලයේ ප්‍රයෝජනය පිණිස තේ සෑදීමේ යන්ත්‍රයක් (NestTea) පරිත්‍යාග කිරීමට යෝජිතව ඇත.

- මවසංගමයේ ආදිශිෂ්‍ය සංගම් කාර්යාලයේ ප්‍රයෝජනය පිණිස ජලබොතල් රඳවනයක් පරිත්‍යාග කිරීමට යෝජිතව ඇත.

- සාමාජිකයින්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දිරිමත් කිරීම උදෙසා ඔවුනගේ අධ්‍යාපන ජයග්‍රහණ වෙනුවෙන් ශිෂ්‍යත්ව වැඩපිලිවෙලක් දියත් කිරීම.
  - ✓ පහ වසර ශිෂ්‍යත්වය සමත් දරුවෙකු සඳහා රුපියල් <u>තුන් දහසක මුල්‍යාධාරයක්</u>

CamScanner

✓ අ.පො.ස සා/පෙළ සියළුම විෂයන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ ලබන දරුවන් සඳහා රුපියල් **හත්දහස් පන්සියයක මුල්‍යාධාරයක්**

✓ අ.පො.ස උ/පෙළ සියළු විෂයන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ ලබන දරුවන් සඳහා රුපියල් **දස දහසක මූල්‍යාධාරයක්**

වශයෙන් ලබාදීමේ අධ්‍යාපන ආධාර ව්‍යාපෘතියක් සිදුකිරීමට යෝජිතව ඇත.

- සාමාජිකයින්ගේ දරුවන් සඳහා උසස් රැකියා අවස්ථා ලබාදීම සඳහා, පිලිගත් උසස් ආයතන වල සේවය කරන අප ආදිශිෂ්‍යන්ගේ සෘජු සම්බන්ධීකරණය මත රැකියා බැංකුවක් ආරම්භ කිරීම පළමු පියවරක් ලෙස ආරම්භ කිරීම. දෙවනුව රැකියා අවස්ථා පුළුල් කිරීම සඳහා එක් දින කඳවුරක් රැකියා අවස්ථා ලබාදියහැකි ආයතන රාශියක් සම්බන්ධීකරණය කර පැවැත්වීමට යෝජිතව ඇත.

- සාමජිකයින්ගේ හා පවුලේ සාමාජිකයින්ගේ ශරීර සුවතාවය වර්ධනය කරනු පිණිස වෛද්‍ය කඳවුරක් සංගමයේ පූර්ණ අනුග්‍රහය මත සංවිධානය කිරීමට යෝජිතයි. මෙම ව්‍යාපෘතිය සංගමය මගින් සංවිධානය කරන ලේ දන්දීමේ ව්‍යාපෘතිය හා සමගාමීව සිදුකිරීමට යෝජිතයි.

- සාමජිකයන් සඳහා රක්ෂණාවරණයක් ලබාදීම ව්‍යාපෘතියක් සංවිධානය කිරීමට යෝජිතව ඇත. මේ සඳහා සාමජිකයා හා සංගමය සම අනුග්‍රහය දැක්වීමේ පදනම මත දියත් කිරීමට යෝජිතයි.

- ඉහත යෝජිත ව්‍යාපෘති සාර්ථකව පැවැත්වීම උදෙසා වාර්ෂිකව රුපියල් ලක්ෂ පහක පමණ වැයක් සංගමයට දැරීමට සිදුවේ යැයි දළ වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර එයට අරමුදල් සැපයීම පිණිස රුපියල් මිලියන දහයක ස්ථිර අරමුදලක් නිර්මාණය කිරීමට යෝජිතයි. මේ සඳහා මුදල් ඉපැයීමේ ව්‍යාපෘති වශයෙන් වේදිකා නාට්‍ය, සංගීත සංදර්ශන වැනි ව්‍යාපෘති සංවිධානය කිරීමට යෝජිතව ඇත.

- ආදිශිෂ්‍ය සංගමයේ ඉල්ලීම හා සෘජු අධීක්ෂණය මත විද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබාදීම. (බෞද්ධ කටයුතු, ක්‍රීඩා උත්සව, ත්‍යාග ප්‍රදානෝත්සව, යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති) *** පවතින කෘත්‍යාධිකාරී මණ්ඩල (සුබසාධක සංගමයේ) අනුමැතියට යටත්විය යුතුය.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ගරු සභාපති | ගරු භාණ්ඩාගාරික | ගරු උපලේකම් |